# නිවේදනය

පසුගිය දින කිහිපය තුළ ඇදහැළුණු ධාරානිපාත වර්ෂාව හේතුවෙන් අප දිවයිනේ දිස්ත්‍රික්ක අටකට ඇති වූ බරපතළ ගංවතුර ආපදාව නිසා, ඉතිහාසයේ පෙර නොවූ විරූ අයුරින් 200 කට අධික වටිනා මිනිස් ජීවිත සංඛ්‍යාවක් අහිමිවීමත්, දහස් සංඛ්‍යාත පිරිස් අවතැන්වීමත්, සිදුවූ විශාල දේපල හානියත්, පිළිබඳව දැඩි කම්පාවෙන් සිහිපත් කරන අතර මෙලෙස අභාග්‍ය සම්පන්න ලෙස ගංවතුර හා විවිධ ස්ථානවල ඇති වූ නායයාම් හේතුවෙන් මෙලොවින් වියෝ වූ ඒ අහිංසක, අසරණ ජීවිත වෙනුවෙන් පාර්ලිමේන්තුවේ සාතිශය සංවේගය පළ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

අපගේ පාලනයෙන් තොර වූ, මෙම ස්වභාවික විපත්තියෙන් අන්ත, අසරණ වූ ජන ජීවිත යළිත් යථා තත්ත්වයට පත් කිරීමේ ඒකායන පරමාර්ථයෙන් මානවීය දයා කරුණාව පෙරදැරි කරගෙන නිල රාජකාරියට වඩා පරිත්‍යාගශීලී ලෙන්ගතුකමකින් කාලය, ශ්‍රමය වැය කරමින් ඉදිරිපත් වී මේ වන විටත් කටයුතු කරමින් සිටින ත්‍රිවිධ හමුදාව, පොලිසිය ඇතුළු සියලුම ආරක්ෂක අංශවලටත්, රාජ්‍ය සේවයේ නිලධාරී මහත්ම මහත්මීන්ටත්, ඊට සම්බන්ධවූ අනෙකුත් සියලුම ආයතන, විවිධ සංවිධාන, පුද්ගලයන්ටත් පාර්ලිමේන්තුවේ කථානායකවරයා ලෙස මාගේ හෘදයාංගම කෘතඥතාවය ඒ සෑම සියලු දෙනා වෙනුවෙන්ම පළකර සිටින බව මෙහිලා සඳහන් කරමි.

එම ප්‍රජා සේවා කටයුතුවල නියැලීමේදී අවාසනාවන්ත ලෙස ජීවිතක්ෂයට පත්වූ එම ගුවන් හමුදා නිලධාරියා ඉතාමත් සංවේදීව සිහිපත් කරන අතරම එම නිලධාරියාගේ දේහයට පාර්ලිමේන්තුව වෙනුවෙන් අවසන් ගෞරව දැක්වීමටද මට හැකි වූ බව ප්‍රකාශ කරමි.

තවද, විවිධවූ මාධ්‍ය ආයතන, මාධ්‍ය වාර්තා කිරීමෙන් ඔබ්බට යමින් අවතැන්වූ, අසරණවූ, තම සහෝදර ජනතාව වෙනුවෙන් ආධාර ලබාදෙමින් සහන සැලසීමෙන් කළාවූ උත්තුංග කාර්ය වෙනුවෙන් සියලුම මාධ්‍ය ආයතනවලටත්, ස්වෙච්ඡා සංවිධානවලටත්, අනෙකුත් පරිත්‍යාගශීලීන්ටත්, මාගේ කෘතවේදිත්වය පිරිනමමි.

රුදුරු ගංවතුර උවදුරින් උන් හිටි තැන් අහිමිවී, අන්ත අසරණ වූ ජනතාවට කිසියම් හෝ සහනයක් ලබාදීමට මා ගිය සෑම තැනකදීම ආණ්ඩු පාර්ශ්වයේ සහ විරුද්ධ පාර්ශ්වයේ සියලුම පාර්ලිමේන්තු ජනතා නියෝජිතයන් අවධාරණය කරමින් පවසා සිටියේ පක්ෂ, පාට, පටු බෙදීම්, පසෙක ලා ඉදිරියේදී මෙවැනි ඛේදවාචකයන්ට මුහුණදීමටත්, ජීවිත, දේපල හානි අවම කර ගැනීමටත්, ආපදා කළමනාකරණය වෙනුවෙන් යෝග්‍ය යාන්ත්‍රණයක් සකස් කිරීම ඉතාමත් කාලෝචිත බවය.

අප දිවයිනේ ඉදිරි පරම්පරාවටත්, නූපන් පරපුරටත්, මෙවන් භයානක ව්‍යසනවලට ගොදුරු නොවීමට මනා අධ්‍යයනයකින් පසුව යෝජිත සැලැස්මක් හා යාන්ත්‍රණයක් සකස් කිරීමට අපි සැවොම අපගේ මේ කුඩා රට වෙනුවෙන් ඉදිරිපත්වීමට සුදුසු කාලය එළඹී තිබෙන බව මොනවට පැහැදිලි වෙයි.

මෙවැනි ක්‍රියාකාරකම් වෙනුවෙන් අති විශාල මුදලක් අවශ්‍ය වුවත්, අපේ රට අද ලෝකයේ හොඳ හිත, සුහදත්වය අත්පත් කරගත් යහපත් රාජ්‍යයක් ලෙස එවැනි මූල්‍ය ප්‍රතිපාදන සොයා ගැනීම දුෂ්කර කාර්යයක් නොවන බව මාගේ එකම විශ්වාසයයි.

එමනිසා පාර්ලිමේන්තුව නියෝජනය කරන සැබෑ, සංවේදී, ජනතා නියෝජිතයන් ලෙස අප සැවොම එකට එකමුතු වී අත්වැල් බැඳගෙන මෙම පොදු අරමුණ වෙනුවෙන් සුදුසු ඉක්මන් වැඩ පිළිවෙළකට අවතීර්ණ වීමට අධිෂ්ඨාන කර ගනිමු. ස්තූතියි.